# සිංහල දුරකථන සංවාද පිළිබඳ අර්ථ විචාරාත්මක අධ්‍යනයක්

ආර්. එම්. ඩබ්. රාජපක්ෂ
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.


## සාරාංශය

භාෂණය මූලික වශයෙන් සංවාද මගින් ඉදිරිපත් වේ. ශාස්ත්‍රීය දේශන, ආගමික දේශන, දේශපාලන කථා ඇතුළු භාෂාමය කාර්‍ය සිපයක් හැරුණු විට එදිනෙදා ජීවිතයේ බහුලව භාවිත වනුයේ සංවාදයි.

භාෂණයේ එන සංවාද අතුරින් දුරකථන සංවාද විශේෂ වෙයි. මුහුණට මුහුණලා කෙරෙන සංවාදවලට වඩා මේවා බෙහෙවින් වෙනස් වේ. සාමාන්‍ය සංවාද වලදී වාගාලාපවලට අමතරව හස්ත සංඥා, ඇස, නාසය, මුහුණේ මස් පිඩු විවිධාකාරයෙන් චලනය කිරීමෙන් මුහුණෙහි ඇති කරන සංඥා ඇතුළු විවිධ අංග චලන මාර්ගයෙන්ද, කියන දේ තහවුරු කිරීම, කියන දේට පරස්පර දේ දැක්වීම ආදි වශයෙන් විවිධ අදහස් ඉදිරිපත් කෙරේ. දුරකථන සංවාදවල දී මෙබඳු අභාෂක සංනිවේදන මාධ්‍ය ක්‍රියාත්මක නොවේ. හඬ භේදය ද ස්වාභාවික සංවාදවල දී තරම් ප්‍රබල නොවේ.

භාෂා සංස්ථිතිය වශයෙන් ද දුරකථන සංවාද වෙනස් වේ. කෙටි බව එක් කරුණකි. දුරකථන සංවාදයන් සඳහා ව්‍යාකරණයක් ද ඉදිරිපත් කළ නොහැකිය. බොහෝ විට ව්‍යාකරණ වශයෙන් පරිපූර්ණ සංස්ථිති එහි නොමැති බැවිනි. කෙසේ වෙතත් සංනිවේදන වශයෙන් ඒවායෙහි කිසිදු අඩුවක් නැත. අර්ථපූර්ණ වේ.

එහි ඇති අර්ථාන්විත භාවය අධ්‍යයනය කළ හැක්කේ ප්‍රකරණ විචාරයට අනුවය. භාෂා සංස්ථිතිය පිළිබඳව පමණක් අවධානය යොමු කොට එය කළ නොහැකිය. ප්‍රකරණ විචාරයේ එන ආදේශක වචන (Dexis) සංවාද ඉංගන (Conversational Implicature), පූර්ව ඉංගන (Pre-Supposition) ආදි කරුණු පදනම් කොටගෙන එබඳු සංවාද පිළිබඳව අර්ථ විචාරාත්මක අධ්‍යයනයක් කළ යුතුය. භාෂක-ශ්‍රාවක දෙදෙනා අතර ඇති සම්බන්ධතාවය, දෙදෙනා අතර පූර්වයෙන් කරන ලද සංවාද පිළිබඳ දැනුම, අභිනය, සිහිය, භාෂා පාඨ හා සාමාජික අවස්ථා පිළිබඳව ඇති දැනුම, එවැනි මාර්ගයෙන් කෙරෙන සන්නිවේදනයේ දී වැදගත් වේ.